පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **- 492**

කම්කරු අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

தொழில் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No - 492

Ministry of Labour

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in term of Standing Oder No. 119(4)

ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාල අංක: **492**

ආයතනයේ නම : **කම්කරු අමාත්‍යාංශය**

	කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
	පළමු කොටස : 98.00	
	• **සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්කාරු කර නොතිබුණි.**	අමාත්‍යාංශය සතු වාහන දෙකක් සඳහා රාජ්‍ය ලාංඡනය ස්ටිකර් මගින් නිරූපනය කිරීමට කටයුතු කර ඇති අතර එවකට තිබූ අනෙකුත් වාහන නිල වාහන ලෙස භාවිතා කර ඇත. දැනට නිල වාහන ලෙස භාවිතා කරන වාහන හැර අනෙකුත් සියලුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය ස්ටිකර් මගින් නිරූපනය කිරීමට කටයුතු කරමින් පවතී.
	• **වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂ පැවතුණි.**	අත්තිකාරම් ගිණුම් ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ. • **ආර්. කේ. ජේ. කුමාරසිරි - (කම්කරු අංශය) ආපදා -රු. 230,300.00** ඇපකරු විසින් ඔහුගෙන් ණය ශේෂය අයකරගැනීම ලිඛිතව ප්‍රතික්ෂේප කර ඇති අතර ආර්. කේ. ජේ. කුමාරසිරි මහතාගේ නීත්‍යානුකූල උරුමකරු වන ආර්. කේ. ලාල් කුමාරසිරි මහතා (පියා) වෙත හිඟ ණය ශේෂය ගෙවා නිම කරන ලෙසත් එසේ නොමැති නම් ඒ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවත් දන්වා 2026.02.27 දින නීති නිලධාරී මගින් ලිපියක් යොමු කර ඇත. • **ඩබ්.ඩී.ජී.සී.සුගතදාස මිය - (කම්කරු අංශය) (රාජ්‍ය කළමණාකරණ සහකාර) ආපදා - රු.138,501.00** කොළඹ දිසා අධිකරණ නඩු අංක DMR 2071/2021 යටතේ නඩුව ක්‍රියාත්මක වන අතර අවසන් වරට 2026.03.27 නඩුව කැඳවා ඇත.

- **වී. පි. සී. ද මෙල් - (කම්කරු අංශය)**
  රු. 114,576.60 (ආපදා - රු. 113,326.60, උත්සව අත්තිකාරම් - රු 1,250.00)

මෙම නිලධාරියා දැනට ආර්ථික දුෂ්කරතා මැද රෝගීව ජීවත් වන බැවින් රජයට අයවිය යුතු ණය ශේෂය පොත් වලින් කපාහැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තුමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එහිදි ලබා දුන් නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවති.

තවද රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ඡේද අංක 04 අනුව මු.රෙ.113 අනුව වෙනත් අත්හැරීම යටතේ මෙම නිලධාරියාගේ උත්සව අත්තිකාරම් මුදල් ශේෂය වන රු.1250.00 මුදල ගිණුම් වලින් ඉවත් කිරීමට අනුමැතිය ලබා ගෙන ඇති අතර මේ සම්බන්ධව ක්‍රියාකරමින් පවති.

- **පී. බී. සරත් කුමාර මයා - (කම්කරු අංශය)**
  ආපදා - රු. 14,541.00

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 (i) හි සංශෝධිත විධිවිධාන අනුව රු. 14,541 මුදල කපාහැරීමට කටයුතු කර ඇති අතර මහා භාණ්ඩාගාරය විසින් මෙම කපාහැරීම් වලට අදාල වැය විෂය අංක සහ ප්‍රතිපාදන ලබා දීමෙන් පසුව පොත් වලින් ඉවත් කිරීමේ කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වමි.

- **ආර්. එම්. එල් ජෙසිල් (විදේශ රැකියා)**
  ආපදා - රු.173,954.00

මෙම ණය ශේෂය රු.2,900.00 බැගින් මාසික වාරික 60 කින් පියවීමට එකඟතාවය පළකර ඇති අතර ඒ අනුව වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. 2025.12.31 දිනට ණය ශේෂ රු. 132,954.00 ක් පැවති අතර 2026.04.21 දිනට ශේෂය රු 123,954.00 කි.

- **පී.ජයප්‍රකාශ් - (විදේශ රැකියා)**
  ආපදා - රු.176,824.00

2024.11.01 සිට ඇපකරුගෙන් වාරික 48 කින් අය කර ගැනීම සිදු කරනු ලබයි. 2025.12.31 දිනට රු.128,724.00 ක්ව පැවති අතර 2026.04.21 දිනට ශේෂය රු.113,924.00 කි.

		• කේ.වෙල්ලප්පිලි - (විදේශ රැකියා) ආපදා රු.95,730.00, විශේෂ රු.2,000.00 මෙම නිලධාරියා අඛණ්ඩව ණය ශේෂ ගෙවීම පැහැරහැර ඇති බැවින් ඔහු එම ණය ගෙවීමට හැකි ආර්ථික මට්ටමක සිටින්නේදැයි විමසා මුලටියන ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යැවීමෙන් පසුව ඔහුට වෙනත් කිසිදු ආදායම් මාර්ගයක් නොමැති නිසා එම මුදල් ගෙවීමට නොහැකි බව දන්වමින් එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් තහවුරු කර මුලටියන ප්‍රාදේශීය ලේකම් විසින් ලිපියක් එවා ඇත. පසුව මෙම ණය ශේෂය කපා හැරීමට නිර්දේශ කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති නමුත් එම ණය ශේෂ තව දුරටත් අයකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දන්වා ඇත. ඉන්පසු ණය මුදල ගෙවීමට ඇති හැකියාව පිළිබඳ විමසා නැවත මුලටියන ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති අතර එයට පිළිතුරු වශයෙන් ඔහුට එම මුදල ගෙවීමට ප්‍රමාණවත් ආදායමක් ලැබෙන්නේද යන්න පිළිබඳව නිවැරදි වාර්තාවක් ලබා දිය නොහැකි බව දන්වා ඇත. ඒ අනුව මෙම නිලධාරියා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. • ආර්.එල්.සී.එස්.පෙරේරා - (විදේශ රැකියා) ආපදා රු. 104,580.00, විශේෂ රු.4,000.00 මෙම නිලධාරියා ණය ගෙවීමට හැකි ආර්ථික මට්ටමක සිටින්නේදැයි යන්න ග්‍රාම නිලධාරී ලවා ලිඛිත තහවුරුවක් මඟින් දන්වන ලෙස දොම්පේ ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇති අතර ඊට පිළිතුරු වශයෙන් ආර්.එල්.සී.එස් පෙරේරා මහතා දැනට ස්ථීර රැකියාවක නිරත නොවන බව වාර්තා කර ඇත. පසුව නඩු පැවරීම සඳහා අතිරේක ලේකම් (නීති) වෙත ලිපිගොනුව යොමු කලද රක්ෂණ හාර අරමුදලට අදාල ලේඛන, ණය හා අත්තිකාරම් වලට අදාල ගිවිසුම් සොයා ගත නොහැකි වීම නිසා ණය ශේෂය කපා හැරීමට නිර්දේශ කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. එහෙත් මෙම ණය ශේෂය තව දුරටත් අයකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දන්වා ඒවා ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරි නෛතික පියවර ගැනීම සඳහා අදාල ලිපි ලේඛන ඉල්ලා ඇති අතර ඒ සඳහා කටයුතු සිදු කෙරේ.

		• කේ.පී.ද සිල්වා - (විදේශ රැකියා) ආපදා - රු. **188,400.00** මෙම නිලධාරියා විසින් ලබාගත් ණය මුදල 2026.03.24 දින වන විට සම්පූර්ණයෙන් ගෙවා නිම කර ඇත.
	<u>දෙවැනි කොටස : **95.00**</u> • **ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.** • **සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.**	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නැවත සකස්කර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇති අතර එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට ද කටයුතු කර ඇත. රාජ්‍ය වියදම් පාලනය කිරීම යටතේ සැලසුම් ගත පුහුණු අවස්ථා සීමා කර ඇත. (ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023)

ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු (පා.ම.)
කම්කරු අමාත්‍යාංශය

ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු
කම්කරු අමාත්‍ය
7 වන මහල,"මෙහෙවර පියෙස",
නාරාහේන්පිට, කොළඹ 05.